SRI LANKA

## ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# 2016 ජනවාරි විභාගය - AA1 මට්ටම

# ප්‍රශ්න සහ යෝජිත උත්තර
# විෂය අංක (AA13)

## ව්‍යාපාර සහ ගිණුම්කරණය සඳහා ආර්ථික විද්‍යාව (EBA)

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය
නො. 540, පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත,
නාරාහේන්පිට, කොළඹ 05.

දුරකථන : 011-2-559 669

මෙය අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශයේ ප්‍රකාශනයකි.

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශය

**2016 ජනවාරි විභාගය - AA1 මට්ටම**

**(13) ව්‍යාපාර සහ ගිණුම්කරණය සඳහා ආර්ථික විද්‍යාව**

# යෝජිත උත්තර

**A කොටස**

**වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)**

**සියලුම ප්‍රශ්නවලට උත්තර අපේක්ෂිතය.**

**(මුළු ලකුණු 40)**

## 1 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

| ප්‍රශ්න අංකය | උත්තරය |
|---|---|
| 1.1 | 3 |
| 1.2 | 2 |
| 1.3 | 3 |
| 1.4 | 2 |
| 1.5 | 3 |
| 1.6 | - |
| 1.7 | 2 ( 4.7%) |
| 1.8 | 2 ( $M_2 = C_p + DD + TSD$ ) |
| 1.9 | 2 |
| 1.10 | 4 |
| 1.11 | සත්‍යයි. |
| 1.12 | අසත්‍යයි. |
| 1.13 | සත්‍යයි. |
| 1.14 | අසත්‍යයි. |
| 1.15 | සත්‍යයි. |
| 1.16 | ආර්ථික සංවර්ධනය |
| 1.17 | මූර්ත වටිනාකම |
| 1.18 | ආදේශක භාණ්ඩ |
| 1.19 | a. එක්සත් රාජධානිය<br>b. එක්සත් රාජධානිය |

1.20 a. එක්සත් රාජධානිය

b. ජපානය

a. අර්තාපල් නිෂ්පාදනයේ සාපේක්ෂ වාසිය

එක්සත් රාජධානිය ; ගම්මිරිස්/අර්තාපල්

6/12=0.5

ජපානය ; ගම්මිරිස්/අර්තාපල්

4/2= 2

**සාපේක්ෂ වාසිය ඇත්තේ එක්සත් රාජධානියටයි.**

b. ගම්මිරිස් නිෂ්පානයේ සාපේක්ෂ වාසිය

එක්සත් රාජධානිය; අර්තාපල්/ගම්මිරිස්

12/6 = 2

ජපානය ; අර්තාපල් /ගම්මිරිස්

2/4 = 0.5

**සාපේක්ෂ වාසිය ඇත්තේ ජපානයටයි.**

SRI LANKA

**_A_ කොටසෙහි අවසානය.**

## B කොටස

සියලුම ප්‍රශ්නවලට උත්තර අපේක්ෂිතය.

(මුළු ලකුණු 40)

## 2 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

(a) **ආර්ථික සම්පත්**

- මිනිස් අවශ්‍යතා ඉටුකර ගැනීමට අදාලව භාණ්ඩ හා සේවා නිපදවීම සඳහා භාවිත කරනු ලබන ඵලදායීතාවයකින් යුත් එසේම හිඟකමකින් යුක්ත නිසාම භාවිතයේ දී ආවස්ථික පිරිවැයක් හට ගන්නා දෑ ආර්ථික සම්පත් ලෙස හැඳින්වේ.

  උදා : සේවක ශ්‍රමය, අමුද්‍රව්‍ය, වාණිජ සම්පත්, ඉඩම්, ගොඩනැගිලි, යන්ත්‍රෝපකරණ, මෝටර් රථ ආදිය.

- ආර්ථික සම්පත්, භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, සහ ව්‍යවසායකත්වය ආදි ලෙස ප්‍රධාන වර්ග 04කට බෙදා දක්වයි.
- කිසියම් සම්පතක පහත සඳහන් ලක්ෂණවලින් අවම වශයෙන් එකක් හෝ අඩංගු වේ නම් එය ආර්ථික සම්පතක් ලෙස හඳුන්වනු ලැබේ.
  - සැපයුම සීමිත බව (හිඟකම)
  - ආවස්ථික පිරිවැය
  - මිලක් පැවතීම හා වෙළෙඳපොළේ ගනුදෙනු වීම
  - පුද්ගලික හිමිකම
  - ආර්ථික සම්පත් නිදහසේ ලබාගත නොහැක. එහි මිලක් තිබේ.

(b) i. **ආවස්ථික පිරිවැය**

- සම්පත් හිඟ නිසාත්, සම්පත්වල විකල්ප ප්‍රයෝජන පවතින නිසාත් ආර්ථික අවශ්‍යතාවක් ඉටුකර ගැනීමේදී එක් අවස්ථාවක් තෝරා ගත් පසු ඒ වෙනුවෙන් කැප කරනු ලබන ඊළඟ හොඳම විකල්ප අවස්ථාවේ වටිනාකම ආවස්ථික පිරිවැයයි.
- මෙය මූර්ත පිරිවැයක් වන අතර මූල්‍ය පිරිවැය අත්‍යවශ්‍යම නොවේ. ආර්ථික ලාභ ගණනය කිරීමේ දී ආවස්ථික පිරිවැය සැලකිල්ලට ගනු ලැබේ.

**ගිණුම්කරණ පිරිවැය**

- භාණ්ඩ හා සේවා නිෂ්පාදන ආයතනයක නිෂ්පාදනයේ දී නිෂ්පාදන සාධක පිටතින් මිල දී ගැනීම සඳහා ඒ වෙනුවෙන් වැය කළ මූල්‍ය පිරිවැය ගිණුම්කරණ පිරිවැයයි.

  උදා : සේවක වැටුප්, අමුද්‍රව්‍ය වියදම්, විදුලිය, ප්‍රවාහන වියදම් ආදිය.

- ගිණුම්කරණ පිරිවැය තුල ඇතුළත් වන්නේ මූල්‍ය පිරිවැය පමණකි. ගිණුම්කරණ ලාභය සෙවීමේ දී මෙම පිරිවැය සැලකිල්ලට ගනු ලබයි.

ii. **ආවස්ථික පිරිවැය**

උදා :- ව්‍යාපාරිකයෙකු තම මුදල් ව්‍යාපාරයේ ආයෝජනය කරයි. ඔහුට එම මුදල් පොලී ලබා ගැනීම සඳහා ආයෝජනය කළ හැකිව තිබුණි. ඔහු කැප කරන ලද පොලී ආදායම ඔහුගේ ආවස්ථික පිරිවැයයි.

**ගිණුම්කරණ පිරිවැය**


උදා :- සේවකයන්ට ගෙවනු ලබන වැටුප්, ගොඩනැගිලි සඳහා ගෙවන කුලිය, අමුද්‍රව්‍ය පිරිවැය

## 3 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

(a) නිදහස් වෙළෙඳපොළ ආර්ථිකයක මූලික ආර්ථික ප්‍රශ්න සහ අනෙකුත් ආර්ථික කටයුතු සම්බන්ධයෙන් තීරණය ගනු ලබන්නේ 'මිල' පදනම් කරගෙනය. මිලෙහි මඟපෙන්වීම යටතේ සියලු තීරණයන් ගනු ලබයි.

මිල තීරණය වන්නේ වෙළෙඳපොළ ඉල්ලුම් බලවේග හා වෙළෙඳපොළ සැපයුම් බලවේග මගිනි. ඉල්ලුම මගින් ගැනුම්කරුවන්ගේ හැසිරීම නිරූපණය වන අතර සැපයුම මගින් විකුණුම්කරුවන්ගේ හැසිරීම නිරූපණය වේ.

ඉහත කී ප්‍රතිවිරුද්ධ බලවේග එකිනෙකට සමාන වන තත්ත්වය වෙළෙඳපොළ සමතුලිතය ලෙස හැඳින්වේ. සමතුලිතයේ දී තීරණය වන මිල සමතුලිත මිල ලෙසත් ප්‍රමාණය සමතුලිත ප්‍රමාණය සමතුලිත ප්‍රමාණය ලෙසත් හැඳින්වේ. සමතුලිතය හරහා ඉල්ලුම් සහ සැපයුම් වෙනස් වීම අනුව මිල වෙනස් වන දිශාව අවබෝධ කර ගත හැක.




$P_1$ මිලේ දී අධි ඉල්ලුම මිල වැඩිවීමට හේතු වේ. $P_3$ මිලේ දී අධි සැපයුම් මිල අඩුවීමට හේතු වේ. ඉල්ලුම් සහ සැපයුම් වක්‍ර එකිනෙක ඡේදනය වන ලක්ෂ්‍යයේ දී සමතුලිතතාවය තීරණය වේ. සමතුලිත මිල $P_2$ වේ. සමතුලිත ප්‍රමාණය $Q_2$ වේ. මෙම ලක්ෂ්‍යයේ දී ඉල්ලුම සැපයුමට සමාන වේ.

(b) ආයතනයක ව්‍යවහාර මෙහෙයුම්වල ඉල්ලුම් සැපයුම් වලදී ඉල්ලුම් සැපයුම් සංකල්ප විවිධ ආකාරයෙන් වැදගත් වේ.

1. ඉල්ලුම් හා සැපයුම් සංකල්ප ව්‍යාපාර මෙහෙයුම්වලට පාදක වේ.
2. ආයතන භාණ්ඩ හා සේවා නිපදවා වෙළෙඳපොළට සපයන්නේ එම භාණ්ඩ සඳහා වෙළෙඳපොළ තුළ ඉල්ලුමක් තිබේ නම් පමණි.
3. භාණ්ඩවල හෝ සේවාවල ඉල්ලුම හා සැපයුම වෙළෙඳපොළෙන් ලබාගත හැකි ආදායම කෙරෙහි බලපායි.
4. මෙම සංකල්පය කෙරෙහි ඇති අවබෝධය ආයතනයට පහත සඳහන් තීරණ ගැනීමේදී උපකාරී වේ.

- විකුණුම් ඇස්තමේන්තු පිළියෙළ කිරීම සහ ආයතනයේ ආදායම් තීරණය කිරීම.
  - මිල වෙනස් වීම අනුව අළෙවි ආදායම වෙනස් වේ. මේ නිසා ආදායම වෙනස් වීම හඳුනා ගැනීමට ඉල්ලුම් සැපයුම් සංකල්ප අවශ්‍ය වේ.
- මිල ප්‍රතිපත්ති සකස් කිරීමේ දී ඉල්ලුම් සැපයුම් සංකල්ප යොදා ගනී.
  - මිල අඩු වැඩි කිරීමේ දී ආයතනයක් විසින් භාණ්ඩ නම්‍යතාවය අවබෝධ කරගත යුතුය. එසේම භාණ්ඩ හිඟ අවස්ථාවකදී මිල ඉහළ යන අතර ආදායම් අඩු වැඩි වීමද ඒ සඳහා බලපායි. මේ පිළිබඳ අවබෝධය ඉල්ලුම් සැපයුම් සංකල්ප වලින් ලැබේ.
- ආයතනයක මිල නොවන ප්‍රතිපත්ති තීරණ ගැනීමේ දී,

  ප්‍රචාරන කටයුතුවලදි එහි පිරිවැය හා අළෙවි ආදායම් අතර සම්බන්ධතාවය වැනි දෑ ඉල්ලුම් සැපයුම් නව්‍යතාවයන් මගින් අවබෝධ කරගත හැක.
- ආදායම් වෙන්වීම හා ව්‍යාපාර චක්‍ර අවබෝධ කර ගැනීම.

  ආදායම් වෙනස් වීම හා ඊට සාපේක්ෂව ව්‍යාපාර ආයතනයේ ආදායම් සහා ලාභ වෙනස් වීම සිදුවන ආකාරය අවබෝධ කරගැනීම සඳහා ඉල්ලුම් සහ සැපයුම් සංකල්ප යොදා ගත හැක.
- විවිධාංගීකරණ කටයුතු වලදී
- බදු ප්‍රතිපත්ති සකස් කිරීමේදී ද ඉල්ලුම් සැපයුම් සංකල්ප යොදාගත හැකි වේ.

## 4 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

(a ) ඒකාධිකාරී තරඟයෙහි ලක්ෂණ

i. අළෙවිකරුවන් හා ගැණුම්කරුවන් රාශියක් සිටීම

ii. එක් එක් ආයතන නිපදවන භාණ්ඩ ප්‍රභේදනය කොට තිබීම.

iii. අළෙවිකරුවන්ගේ භාණ්ඩ එකිනෙකට කිට්ටු ආදේශ වීම.

iv. අබාධ පිවිසුමක් හා අබාධ පිටවීමක් පැවතීම.

v. මුළු වෙළෙඳපොළේ සැපයුමෙන් එක් ආයතනයකට හිමිවන්නේ සුළු ප්‍රතිශතයක් වීම.

vi. භාණ්ඩ ප්‍රභේදනය නිසා නිෂ්පාදකයාට තම භාණ්ඩයේ මිල කෙරෙහි බලපෑමක් කළ හැකි වීම.

vii. තියුණු ප්‍රචාරණයක් පැවතීම.

(b) මුදලට ඇති ඉල්ලුම ප්‍රධාන සාධක තුනක් මත රඳා පවතී.

i. ගනුදෙනු චේතනාව

ii. ආරක්ෂණ චේතනාව/පූර්වාරක්ෂණ චේතනාව

iii. සමපේක්ෂණ චේතනාව

i. **ගනුදෙනු චේතනාව**

මින් අදහස් කරන්නේ පුද්ගලයන් එදිනෙදා ගනුදෙනු කිරීම සඳහා යෙදවීමට තමන් සතු වත්කම් වලින් කොටසක් මුදල් වශයෙන් ළඟ තබා ගන්නා බවයි. එයට හේතුව වෙනත් වත්කම් මෙන් නොව මුදල් ඍජුවම ගනුදෙනු සඳහා භාවිතා කළ හැකි වීමයි.

ii. **ආරක්ෂණ චේතනාව/පූර්වාරක්ෂණ චේතනාව**

එනම් හදිසි ආපදාවකදී, ප්‍රයෝජනයට ගැනීම හා මුදල් ළඟ තබා ගැනීම සඳහා දක්වන කැමැත්තයි. මෙවැනි අවස්ථාවලදී එවැනි ආපදාවකට මුහුණ දීම සඳහා තම වත්කම් වලින් කොටසක් මුදලින් ළඟ තබා ගනී.

iii. **සමපේක්ෂණ චේතනාව**

මූල්‍ය වෙළෙඳපොළේ සිදුවිය හැකි වාසිදායක තත්ත්වයන්ගෙන් ප්‍රයෝජන ගෙන අනාගතයේදී ලාභ ලැබීමේ පරමාර්ථයෙන් මුදල් ළඟ තබා ගැනීමට දක්වන කැමැත්තයි.


උදා : වෙළෙඳපොළේ කොටස් මිල අඩුවන විට කොටස් මිලට ගැනීම සහ දේපොළ හෝ භාණ්ඩ අඩු මිලට විකිණෙන විට ඒවා මිලට ගැනීම සඳහා

## 5 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

(a) **රාජ්‍ය අයවැය ලේඛනයක ප්‍රධාන අරමුණු**

- i. ආර්ථික ස්ථායීතාව ආරක්ෂා කර ගැනීම.
- ii. හිඟ සම්පත් සාධාරණ ලෙස බෙදා හැරීම.
- iii. ආදායම් ප්‍රතිව්‍යාප්තියක් ඇති කිරීම.
- iv. ආර්ථික වර්ධනයට හා සංවර්ධනයට අවශ්‍ය කටයුතු සැලසීම.
- v. යටිතල පහසුකම් සැපයීම.
- vi. කාලීන දේශපාලනික අරමුණු මුදුන් පමුණුවා ගැනීම.

(b ) මිලදී ගැනීමේ අවම මිලක් පැනවීම පහත ආකාරයෙන් පහදා දැක්විය හැක.




1. නිෂ්පාදකයන් ආරක්ෂා කිරීමට බොහෝවිට මිලදී ගැනීමේ අවම මිල භාවිතා කරයි. මෙහි අරමුණ නිෂ්පාදකයන්ට සාධාරණ මිලක් ලබාදීම සහ ඔවුන්ගේ ආදායම ආරක්ෂා කිරීමයි.
2. අවම මිල, අධි සැපයුමක් (අතිරික්තයක්) වෙළෙඳපොළෙහි ඇති කරයි.
3. අධි සැපයුම ඉවත් කිරීමට අවශ්‍ය පියවරයන් නොගතහොත් වෙළෙඳපොළ මිල ඉතා පහළ මට්ටමකට අඩු වීමට ප්‍රවණතාවයක් ඇති වී නිෂ්පාදකයන්ට බොහෝ දුෂ්කරතා ඇති වේ.

4. වෙළෙඳපොළෙහි අධි සැපයුම ඉවත් කිරීමට පහත සඳහන් පියවර ගැනීමට රජයට සිදුවේ.

   - අධි සැපයුම මිලදී ගෙන අනාගත භාවිතය සඳහා ගබඩා කිරීම
   - අධි සැපයුම අපනයනය කිරීමට පියවර ගැනීම
   - අධි සැපයුම යොදාගෙන ආදේශක (විකල්ප) භාණ්ඩ නිපදවීමට ආයතන දිරිගැන්වීම

5. මෙම අධි සැපයුම භාවිතා කළ නොහැකි වුවහොත් හා ගැනුම්කරුවන් සොයාගත නොහැකි වුවහොත් සම්පත් බෙදාහැරීමේ අකාර්යක්ෂමතාවන් ඇතිවීම සිදුවේ.

6. අතරමැදියන්ට නිෂ්පාදනය, විශේෂයෙන් සුළු නිෂ්පාදකයන්ගෙන් අව මිලට මිලදීගෙන අවම මිලට විකිණීමේ හැකියාවන් තිබේ.

7. ඉහළ අවශ්‍යතාවක් ඇති වුවහොත් ගබඩා කිරීමේ ප්‍රශ්න ඇති වේ.

***B* කොටසෙහි අවසානය.**

## C කොටස

සියලුම ප්‍රශ්නවලට උත්තර අපේක්ෂිතය.

(මුළු ලකුණු 20)

# 6 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

(a) i. <u>ජාතික ආදායම් ගිණුම්කරණයේ භාවිතයන්</u>

1. සමස්ත ආර්ථික ක්‍රියාවලියෙහි කාර්යසාධනයේ ප්‍රධාන දර්ශකය ජාතික ආදායමයි. යම් කාලයක් තුළ දී, සාමාන්‍යයෙන් වර්ෂයක කාලයක් තුළ රටක සම්පත්වලින් නිපදවන ලද භාණ්ඩ හා සේවාවල මුළු වටිනාකම අවබෝධ කරගැනීමට ජාතික ආදායම උපකාරී වේ.
2. ආර්ථිකයේ විවිධ අංශවල කාර්යසාධනය මැනබැලීමට ජාතික ආදායම භාවිත කළ හැකිය.
3. වර්ෂ අතර සැසඳීම සඳහා එය යොදාගත හැකිය. වර්ෂ අතර අර්ථවත් සැසඳීමක් සිදුකිරීමට උද්ධමනය සඳහා ගැලපීමක් කරනු ලැබේ.
4. වෙනත් රටවල් සමග සංසන්දනය සඳහා ජාතික ආදායම, විශේෂයෙන් ඒකපුද්ගල ආදායම භාවිත කළ හැකිය.
5. සම්පත් භාවිතයේ රටාව අවබෝධ කරගැනීමට උපකාරී වන අතර සම්පත් අපයෝජනයක් තිබේ නම් හඳුනා ගැනීමට උපකාරී වේ.
6. රටෙහි ජීවන මට්ටම මැන බැලීමට යොදාගත හැකි වන අතර වර්ෂ අතර සැසඳීම සඳහා ද යොදාගත හැකිය.
7. රටෙහි පරිභෝජනය සහ ආයෝජනය සඳහා වියදමේ ප්‍රමාණය සහ ඉතිරි කිරීමේ ප්‍රමාණය ඇස්තමේන්තු කිරීමට එය යොදාගත හැකිය.
8. ආර්ථික සැලසුම් සකස් කිරීමට සහ ප්‍රගති සමාලෝචනයට යොදාගත හැකිය.
9. රටෙහි ආර්ථික වර්ධනය මැනීමට එය යොදාගනී.

ii. <u>ජාතික ආදායම් ගිණුම්කරණයේ සීමාවන්</u>

1. ජාතික ආදායම මනිනු ලබන්නේ දේශීය ආර්ථික නිමැවුම්වල වටිනාකම්වලින් පමණි. සමාජ සුබසාධනය මනිනු නොලැබේ.
2. මෙම සංඛ්‍යා ආදායම් ව්‍යාප්තිය නොසලකා හරිනු ලබන අතර එය ආදායම් බෙදීයාමේ විෂමතාව සැලකිල්ලට නොගනී.
3. ගණනය කිරීමේ දෝෂ, කලුකඩ වෙළෙඳාමේ සහ නීතිවිරෝධී ක්‍රියාවලීන් ඇතුළත් නොවීම
4. විවේකය හෝ වැඩ කිරීමේ තෘප්තිය මනිනු නොලබයි.
5. නිෂ්පාදනයේ ගුණාත්මක බව වෙනස්වීම් මනිනු නොලැබේ.
6. පරිසර දූෂණය වැනි පරිසරයට සිදුවන බලපෑම් නිවැරදිව පිළිබිඹු නොවේ.
7. ක්ෂයවීම් ඇස්තමේන්තු කිරීමේ ගැටලු
8. විශේෂයෙන් නිත්‍යානුකූල නොවන ආර්ථික ක්‍රියාවන් සහ වෙළෙඳපොළ හරහා ගමන් නොකරන භාණ්ඩ හා සේවාවලට සම්බන්ධ තොරතුරු ලබාගැනීමේ අපහසුතාව
9. ස්වයං පරිභෝජනය සඳහා නිපදවන භාණ්ඩ ඇතුළත් නොවීම
10. ගෘහණියන්ගේ සේවා ඇතුළත් නොවීම
11. අධ්‍යාපනය, සෞඛ්‍ය, ආරක්ෂාව වැනි පොදු සේවාවන්වල නියම වටිනාකම ඇතුළත් නොවීම

(b) (i) <u>සාධක පිරිවැය මිලට දළ දේශීය නිෂ්පාදිතය</u>


| අයිතමය | | රු. මිලියන |
|---|---|---|
| පෞද්ගලික පරිභෝජනය | | 30 |
| රජයේ පරිභෝජනය | | 07 |
| දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | | 08 |
| **දළ දේශීය වියදම** | | **45** |
| එකතු කළා - ශුද්ධ අපනයන - අපනයන | 10 | |
| - ආනයන | (12) | (02) |
| වෙළඳ මිලට දළ දේශීය නිෂ්පාදිතය | | 43 |
| **අඩුකළා** | | |
| වියදම මත බදු | | (06) |
| **එකතුකළා** | | |
| සහනාධාර | | 02 |
| **සාධක පිරිවැය මිලට දළ දේශීය නිෂ්පාදිතය (GDP)** | | **39** |

(ii) <u>සාධක පිරිවැය මිලට දළ ජාතික නිෂ්පාදිතය</u> **(GNP)**

| | | රු. මිලියන |
|---|---|---|
| සාධක පිරිවැය මිලට දළ දේශීය නිෂ්පාදිතය | | 43 |
| **එකතුකළා** - විදේශ ශුද්ධ සාධක ආදායම් | | (1) |
| **වෙළෙඳපොළ මිල මත දළ ජාතික නිෂ්පාදිතය** | | **42** |
| අඩු කළා - වියදම මත බදු | 6 | |
| එකතු කළා - සහනාධාර | 2 | (4) |
| **සාධක පිරිවැය මිලට දළ ජාතික නිෂ්පාදනය** | | **38** |

(c) . <u>ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය</u>

1. සමස්ත ඉල්ලුම සමස්ත සැපයුමට වඩා වැඩි වේගයෙන් වැඩිවන විට නොකඩවා මිල ගණන් ඉහළ යාමේ ප්‍රවණතාවක් ඇතිවිට 'ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය' නම් වේ.
2. සමස්ත පරිභෝජනය, සමස්ත ආයෝජනය, රජයේ වියදම, නැතහොත් මේ සියල්ලන්ගේ ම සංයෝගයන් නිසා සමස්ත ඉල්ලුම වැඩිවිය හැක. පුද්ගලයන්ගේ ඉල්ලීම වැඩිවීම පිටුපස ඇත්තේ මුදල් ලබාගැනීමේ හැකියාවයි.
3.





AD = සමස්ත ඉල්ලුම
AS = සමස්ත සැපයුම

$AD_1$ වලදී මිල $P_1$ වේ. සමස්ත ඉල්ලුම වැඩි වූ විට $AD_1$ වක්‍රය $AD_2$ වලට විතැන් වන අතර මිල $P_2$ දක්වා ඉහළ යයි.

<u>පිරිවැයෙන් තල්ලුවුණු උද්ධමනය</u>

1. පිරිවැයෙන් තල්ලුවුණු උද්ධමනය සැපයුම් අංශයෙන් ආරම්භ වන අතර සාමාන්‍යයෙන් එය නිෂ්පාදන පිරිවැය වැඩිවීමේ ප්‍රතිඵලයකි.
2. සැපයුම් අංශයෙන් උද්ධමනය ඇතිවිය හැකි හේතු -
   - i. සමස්ත සැපයුමට, විශේෂයෙන් කෘෂිකාර්මික අංශය තුළ, බලපාන පුළුල්ව පැතිරුණු නියඟ හෝ ගංවතුර
   - ii. නිෂ්පාදනයට සහ බෙදාහැරීමට බලපාන පුළුල්ව පැතිරුණු ශ්‍රමික වැඩ වැරීම්
   - iii. වෘත්තීය සංගම් ක්‍රියාකාරකම් නිසා ඇතිවන විශාල ලෙස වැටුප් වැඩිවීම්
   - iv. දේශීය මූලාශ්‍රවලින් සැපයෙන යෙදවුම්වල මිල ගණන් ඉහළ යාම
   - v. ජාත්‍යන්තර භාණ්ඩවල මිල ඉහළ යාම හෝ දේශීය මුදල් අවප්‍රමාණය වීම නිසා ආනයන යෙදවුම්වල සහ අවසාන භාණ්ඩවල මිල ගණන් ඉහළ නැගීම
3. සමස්ත සැපයුම් වක්‍රය $AS_1$ සිට $AS_2$ වලට විතැන් වේ. ඉල්ලුමෙහි වෙනසක් සිදු නොවේ. එමනිසා භාණ්ඩවල මිල $P_1$ සිට $P_2$ වලට වැඩි වේ.




**$C$ කොටසෙහි අවසානය.**

## *Notice :*

These answers complied and issued by the Education and Training Division of AAT Sri Lanka constitute part and parcel of study material for AAT students.

These should be understood as Suggested Answers to question set at AAT Examinations and should not be construed as the "Only" answers, or, for that matter even as "Model Answers".

The fundamental objective of this publication is to add completeness to its series of study texts, designs especially for the benefit of those students who are engaged in self-studies. These are intended to assist them with the exploration of the relevant subject matter and further enhance their understanding as well as stay relevant in the art of answering questions at examination level.

*© 2014 by the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*
*All rights reserved. No part of this document may be reproduced or transmitted in any form or by any means, electronic, mechanical, photocopying, recording or otherwise without prior written permission of the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*